ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2019

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. මෙම ප්‍රශ්න පත්‍රය මගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිලිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවට අනුව ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයිය යුතුවේ. ප්‍රශ්න 10 සඳහා තිබුණේ පහත සඳහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලින් මෙම කොටස සමන්විත විය. සියලුම ප්‍රශ්න වලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

එක් අනිවාර්ය ප්‍රශ්නයකි.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

**ප්‍රශ්න අංක 01** - (ලකුණු 20)

මෙම ප්‍රශ්නය පිරිවැය ගිණුම්කරණ මූලධර්ම සහ මූලික ගණනය කිරීම් කෙරෙහි ප්‍රධාන වශයෙන් කේන්ද්‍රගතව තිබුණි. මෙම ප්‍රශ්නයේ වාස්තවික ප්‍රශ්න 8 ක් තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බහුතරය නියමිත ලකුණු 20 න් ඉහළ ලකුණු ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට පිරිවැය මධ්‍යස්ථාන අතර පොදුකාර්ය බෙදා වෙන්කිරීම පිලිබඳව වූ ප්‍රශ්න 1.4 ට උත්තර සැපයීමට නොහැකි විය. වෙන්කිරීම හා බෙදාහැරීම අතර වෙනස ගැන අයදුම්කරුවන්ට පැහැදිලි අවබෝධයක් නොතිබූ බව පෙනී ගියේය. පෙරසැරි පිරිවැයකරණය, කොන්ත්‍රාත්තු පිරිවැයකරණය සහ කාර්යය පිරිවැය කරණය යන මේවායේ අවශ්‍යතා පිලිබඳ දැනුම නොමැති වීම නිසා 1.7 ප්‍රශ්නයට උත්තර ලිවීමට බොහොමයක් අයදුම්කරුවන්ට නොහැකි විය.

න්‍යායාත්මක පැතිකඩ මෙන්ම දෙනුලබන සිද්ධිදාමය පිලිබඳ හොඳ අවබෝධයක් අයදුම්කරුවන් තුළ තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

<u>B කොටස</u>

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කිරීමද, **(b) කොටසින්** ආර්ථික ඇණවුම් ප්‍රමාණ ආකෘතියක උපකල්පන දෙකක් සඳහන් කිරීමද අවශ්‍ය විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරය **(a) කොටසට** උත්තර සපයා තිබුණි. අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකුට සූත්‍රයේ "Co ඇණවුමක ඇණවුම් පිරිවැය" ලෙසද "Ch ඒකකයක් රඳවාගැනීමේ පිරිවැය" ලෙසද හඳුනාගත හැකිවී නැත. එමනිසා ප්‍රශ්නය සඳහා වෙන්කළ මුළු ලකුණු ලබාගැනීමට නොහැකි විය. කෙසේවෙතත්, අයදුම්කරුවන් කීපදෙනෙකු **(b) කොටස** සඳහා නිවැරදි උපකල්පන ලියා තිබුණි.

EOQ ආකෘතියේ සහ දෙනු ලබන තොරතුරු සූත්‍රයට නිසිලෙස ආදේශ කිරීම ගැන අයදුම්කරුවන් පරිපූර්ණ අවබෝධයක් ලබා තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

විකුණුම් අයවැය සහ නිෂ්පාදන අයවැය ගැන මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

කෙසේවෙතත්, **(a) කොටසට** අදාලව අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු අයවැයගත විකුණුම්වලටද, ආරම්භක තොග සහ අවසාන තොග ගැලපීම් සිදුකර ඇත.

**(b) කොටස** සඳහා අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකු නිෂ්පාදන අයවැය පිළියෙල කිරීමේදී මුළු විකුණුම් වටිනාකම (ඒකක මිල x විකුණු ඒකක) සළකා බලා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයෙන් මුල්‍ය ගිණුම් හා පිරිවැය ගිණුම් අතර ලාභය සැසඳීම පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ.

අයදුම්කරුවන් බොහොමයක් මෙම ප්‍රශ්නයට උත්තර නොලියා සිටීම හෝ නිවැරදි උත්තරයක් නොලිවීම හෝ සිදුකර තිබුණි. කෙසේවෙතත් සමහර අයදුම්කරුවන් ලකුණු 5 න් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය. අයදුම්කරුවන්ගෙන් බොහොමයකට ලාභය සැසඳීම යන සංකල්පය පිළිබඳ නියම අවබෝධයක් නොමැති විය. එබැවින් ඔවුන් සැසඳීම සඳහා ඇති ආකෘතිය භාවිත කිරීම වෙනුවට T ගිණුම් පිළියෙල කර තිබුණි. තවත් සමහර අයදුම්කරුවන් සැසඳීම වෙනුවට, මුල්‍ය ගිණුම් අනුව ලාභය සහ පිරිවැය ගිණුම් අනුව ලාභය අතර, ගණිතමය වෙනස පමණක් පෙන්වා තිබුණේය. ලාභ සැසඳුම පිළියෙල කිරීමේදී (+) සහ (-) ලකුණු සමහර අයදුම්කරුවන් සළකා බලා නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නයෙන් කාණ්ඩ පිරිවැය ගණනය කිරීම පරීක්ෂාවට ලක්කර තිබේ.

අයදුම්කරුවන් බොහොමයක් ලකුණු 5 න් මුළු ලකුණු ප්‍රමාණයම ලබාගැනීමට සමත් විය. කෙසේවෙතත් අයදුම්කරුවන් සමහර දෙනෙකුට නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය නිවැරදිව ගණනය කිරීමට හැකි වූයේ නැත. ඔවුන්ට පොදුකාර්ය පිරිවැය නොසළකා කාණ්ඩයේ මුළු පිරිවැය ගණනය කිරීම නිසා නිවැරදි උත්තරය ලබාගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 06

කැලි අනුපාත ක්‍රමය භාවිත කරමින් සේවකයන් දෙදෙනෙකුගේ ඉපැයීම් වෙන් වෙන්ව ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ත කාර්යසාධනය දුර්වල විය. අයදුම්කරුවන් බොහොමයකට මේ සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට නොහැකි විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ප්‍රසාද දීමනාව නිවැරදිව ගණනය කර නොතිබූ අතර, එමනිසා ඔවුන්ට නිවැරදි උත්තරය ලබාගැනීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුවේ පිරිවැය විභජනය කර බෙදා හරින ආකාරය පෙන්වන ප්‍රකාශනයක් **(a) කොටසින්ද,** එක් එක් නිෂ්පාදන දෙපාර්තමේන්තුව සඳහා සෘජු ශ්‍රම පැයකට පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීම **(b) කොටසින්ද** මෙම ප්‍රශ්නයේදී පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා ලකුණු ලබාගෙන තිබුණි.

කෙසේවෙතත්, ඇතැම් අයදුම්කරුවන් එක් එක් පිරිවැය මධ්‍යස්ථානයට පොදුකාර්ය විභජනය කිරීමේ තාර්කිකය අවබෝධ කරගෙන තිබුණේ නැත. එමනිසා, ප්‍රශ්නයේ දී තිබූ තොරතුරු පමණක් ඔවුන් ඒ ආකාරයෙන්ම ලියා තිබුණි.

කෙසේවෙතත්, බහුතරය විසින් සේවා දෙපාර්තමේන්තුවලට පොදුකාර්ය පිරිවැය බෙදාහරින ආකාරය නිවැරදිව කර පෙන්වා තිබුණි.

වැඩිපුර පරිචයේ යෙදීම සහ මූල්‍ය ගිණුම්කරණ සංකල්පය තේරුම් ගැනීම කාර්යසාධනය වැඩිදියුණු කරගැනීමට උපකාර වනු ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 08

පෙරසැරි ගිණුම් පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබූ අතර, වැඩි ලකුණු ලබාගෙන තිබුණි. සමහර අයදුම්කරුවන්ට පෙරසැරි ගිණුම් පිළියෙල කරන්නේ කෙසේදැයි අවබෝධයක් තිබුණේ නැත. ඔවුන්ගෙන් සමහර දෙනෙක් "T" ගිණුම් වෙනුවට ප්‍රකාශන ආකෘතිය භාවිත කර තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරය සාමාන්‍ය අපතය නිවැරදිව ගණනය කර තිබූ නමුත් ආසාමාන්‍ය අපතය හඳුනාගෙන තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

අන්තර්ග්‍රහණ පිරිවැයකරණ ක්‍රමය යටතේ ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීම සහ විකුණුම් දායකත්ව අනුපාතය / ලාභ පරිමා අනුපාතය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ.

අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේ නැත. සමහරු අන්තර්ග්‍රහණ පිරිවැය ක්‍රමය වෙනුවට ආන්තික පිරිවැයකරණ ක්‍රමය භාවිත කර තිබුණි. ස්ථාවර පිරිවැය අනුපාතය වැරදියට ගණනය කර තිබුණේය. එහි ප්‍රතිඵලයක් ලෙස ඒකකයක මුළු පිරිවැය වැරදී ගිය අතර, ඔවුනට අවසාන තොගයේ නිවැරදි අගයද ලබාගත නොහැකි වී ඇත.

කෙසේවෙතත්, අයදුම්කරුවන්ගෙන් බහුතරය ලාභ පරිමා අනුපාතය නිවැරදි ලෙස ගණනය කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක නොවීය.**

# D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

## ප්‍රශ්න අංක 10

මුදල් අයවැය පිළියෙල කිරීම සහ විචලන (විශ්ලේෂණ) ගණනය කිරීම ඇතුලත් කොටස් දෙකකින් මෙම ප්‍රශ්නය සමන්විත විය. අයදුම්කරුවන්ගෙන් කිපදෙනෙකු පමණක් මෙම ප්‍රශ්නයට ඉහළ ලකුණු ලබාගෙන තිබුණේය. සෙසු අය අඩු ලකුණු ලබා තිබුණි.

**(A) කොටස**

**මුදල් අයවැය පිළිබඳ කොටස:**

මාසික පදනමට ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ නිදර්ශනය කිරීමට භාවිතයට නියමකර ඇති ආකෘතිය සමහර අයදුම්කරුවන් යොදාගෙන තිබුණේ නැත. සමහර අයදුම්කරුවන් "T" ගිණුම් පමණක් කෙටුම්පත් කර තිබුණි. ණය ලැබීම් අයවැයෙහි මුදල් ලැබීමක් ලෙස බහුතරය ගෙන තිබුණේ නැත. ණය ගෙවීම, මුදල් ගෙවීමක් ලෙස සමහර අයදුම්කරුවන් මුදල් අයවැයට ගෙන නොතිබුණි. අයදුම්කරුවන් කිපදෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේ නැත. මෙය අවසාන ප්‍රශ්නය නිසා කාලය මදිවීම සේ සඳහා හේතු විය හැකිය. කාලය කළමනාකරණය කර ගැනීමේ අකාර්යක්ෂමතාවය මෙහින් පෙනී යයි.

**(B) කොටස - විචලන පිළිබඳ කොටස:**

**විචලනයන් ගණනය කිරීම:**

සැළකිය යුතු අයදුම්කරුවන් ගණනකට විචලනයන් පිළිබඳ මූලික දැනුම හා අවබෝධය නොතිබූ බැව් පෙනුණි. බිවුන්ගෙන් සමහරෙකු කිසිදු ගණනය කිරීමක් නැතිව සූත්‍ර පමණක් ලියා තිබෙනු දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් වාසි "F" (Favorable) හෝ අවාසි "A" (Adverse) සළකුණු කර තිබුණේ නැත. සෘජු ද්‍රව්‍ය භාවිත විචලනය, සෘජු ද්‍රව්‍ය පිරිවැය විචලනය සහ සෘජු ශ්‍රම කාර්යක්ෂමතා විචලනය යන මේවා ගණනය කිරීමේදී දුර්වල කාර්යසාධනය නිරීක්ෂණය විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවිය.**

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

(3) ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

(4) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

(5) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(6) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

(7) ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

(8) මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

(9) විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

(10) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -